වගා සහනාධාර චක්‍රලේඛ අංක - 87

අපේ අංකය:-සං/01

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

අංක 70, පාර්ලිමේන්තු පාර,

පැලවත්ත, බත්තරමුල්ල.

2021.07. 07

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්,

**තේ නැවත වගාව සහ අළුත්වගාව යටතේ ගෙවනු ලබන සහනාධාර මුදල වැඩි කිරීම.**

තේ නැවත වගාව සහ අළුත් වගාව යටතේ ගෙවනු ලබන සහනාධාර මුදල 2021.01.01දින සිට බල පැවැත්වෙන පරිදි පහත සඳහන් ආකාරයට වැඩි කරනු ලැබ ඇත.

ඉහත වගා ක්‍රමවලට අදාලව 2021.01.01 දින සිට නිකුත් කරනු ලබන අවසරපත්‍ර සඳහා පමණක් වැඩි කරන ලද සහනාධාර මුදල අනුව ගෙවීම් කටයුතු කල යුතු අතර 2021.01.01 දිනට පෙර නිකුත් කරන ලද අවසරපත්‍ර සඳහා 2015.05.13 දාතමින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 74 පරිදි ගෙවීමට කටයුතු කල යුතුය.

**1. තේ නැවත වගාව.**

තේ ඉඩම් වල පාංශු සාරවත්භාවය පදනම් කර ගනිමින් පස සාරවත් කිරීම සහිතව හා පස සාරවත් කිරීමෙන් තොරව තේ නැවත වගාව සඳහා අවසර පත්‍ර ලබා දීමට කටයුතු කල හැක.

(අ.) පස සාරවත් කිරීම සහිතව තේ නැවත වගා කිරීම.

I. පස සාරවත් කිරීම සහිතව තේ නැවත වගාව සඳහා දැනට ගෙවනු ලබන හෙක්ටයාරයකට රු. 500,000/= ක් වූ සහනාධාර මුදල සියලුම වගා කලාප සඳහා හෙක්ටයාරයකට රු.630,000/= ක් වන පරිදි වැඩි කර ඇති අතර එම මුදල පහත දැක්වෙන ආකාරයට ගෙවීමට කටයුතු කල යුතුය.

| වාරිකය | හෙක්ටයාරයකට (රුපියල්) |
|---|---|
| 1.බිම් සැකසීම | 180,000 |
| 2.පස සාරවත් කිරීම I | 50,000 |
| 3.පස සාරවත් කිරීම II | 200,000 |
| 4.වගාව | 140,000 |
| 5.වසරකට පසු නඩත්තුව | 60,000 |
| **එකතුව** | **630,000** |

II. පස සාරවත් කිරීම සහිතව තේ නැවත වගාව යටතේ එක් ඉඩම් හිමියෙකුට වසරකට අවසර පත්‍ර නිකුත් කරන උපරිම බිම් ප්‍රමාණය හෙක්ටයාර් 02 සිට හෙක්ටයාර 04 දක්වා වැඩි කරනු ලැබේ.

(ආ.) පස සාරවත් කිරීමෙන් තොරව තේ නැවත වගා කිරීම.

I. පස සාරවත් කිරීමෙන් තොරව තේ නැවත වගා කරනු ලබන ඉඩම් සඳහා පහත සඳහන් පරිදි හෙක්ටයාරයකට රු.500,000 වන සේ ගෙවීම් කටයුතු කලයුතු වේ.

| වාරිකය | හෙක්ටයාරයකට (රුපියල්) |
|---|---|
| 1.බිම් සැකසීම | 180,000 |
| 2.තේ වගාව | 260,000 |
| 3.වසරකට පසු නඩත්තුව | 60,000 |
| **එකතුව** | **500,000** |

II. තේ පර්යේෂණායතනයේ මාර්ගෝපදේශ අංක 1/2018 අනුව විවිධ තේ කලාප සඳහා නිර්දේශිත පාංශු තත්ව දර්ශක (SQI) අගයට නොඅඩු අගයක් පෙන්නුම් කරන ඉඩම් සඳහා පස සාරවත් කිරීමෙන් තොරව තේ නැවත වගාව සඳහා අවසරපත් නිකුත් කල හැකිය. මේ යටතේ උපරිම හෙක්ටයාර 4 ක් දක්වා අවසරපත්‍ර නිකුත් කල හැක.

III. චක්‍රලේඛ අංක 81 මගින්, චක්‍රලේඛ අංක 76 අනුව RP/A අවසරපත්‍ර නිකුත් කිරීම අත්හිටුවීම ඉවත් කරන අතර ඉහත සඳහන් වැඩිකරන ලද සහනාධාර වාරික අදාල කර ගනිමින් චක්‍රලේක අංක 76 හි (ආ.) ii, iii, iv, v නියමයන්ට අනුගතව අක්කර 1 ක් හෝ ඊට අඩු බිම් ප්‍රමාණයක් හිමි කුඩා තේ වතු හිමියන්ට අක්කර 1 ක් දක්වා පස සාරවත් කිරීමෙන් තොරව නැවත වගාව සඳහා අවසරපත්‍ර නිකුත් කල හැකිය.

IV. ඉහත අංක ii යටතේ අවසරපත්‍ර නිකුත් කිරීමේ දී පරිගණක වැඩසටහනේ SQI කේතය යොදා ගත යුතු අතර අංක iii යටතේ අවසරපත්‍ර නිකුත් කිරීමේ දී RPA කේතය යොදා ගත යුතුය.

## 2. තේ අළුත් වගාව.

ක්ෂේත්‍ර පරීක්ෂණවල නිර්දේශ පදනම් කරගෙන පහත සඳහන් පරිදි පස සාරවත් කිරීම සහිතව හා පස සාරවත් කිරීමෙන් තොරව තේ අලුත් වගාව යටතේ අවසරපත්‍ර නිකුත් කිරීමට කටයුතු කල හැකිය.

පස සාරවත් කිරීම සහිතව හෝ පස සාරවත් කිරීමෙන් තොරව අළුත් වගාව යටතේ එක් ඉඩම් හිමියෙකුට වසරකට අවසර පත්‍ර නිකුත් කරනු ලබන උපරිම් බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.4047 (අක්.01) කට සීමාකෙරේ.

(අ.) <u>පස සාරවත් කිරීම සහිතව - තේ අලුතින් වගා කිරීම.</u>

පස සාරවත් කිරීම සහිතව තේ අලුත් වගාව සඳහා දැනට ගෙවනු ලබන හෙක්ටයාරයකට රු. 400,000/= ක් වූ සහනාධාර මුදල හෙක්ටයාරයකට රුපි. 500,000/= වන පරිදි සංශෝධනය කර ඇති අතර එම මුදල පහත පරිදි ගෙවීම් කිරීමට කටයුතු කල යුතුය.

| වාරිකය | හෙක්ටයාරයකට (රුපියල්) |
|---|---|
| 1.බිම් සැකසීම | 140,000 |
| 2.පස සාරවත් කිරීම I | 50,000 |
| 3.පස සාරවත් කිරීම II | 200,000 |
| 4.තේ වගා කිරීම | 60,000 |
| 5.වසරක් තුල නඩත්තුව | 50,000 |
| **එකතුව** | **500,000** |

(ආ.) පස සාරවත් කිරීමෙන් තොරව - තේ අලුතින් වගා කිරීම.

I. මෙම අවසරපත්‍ර සඳහා ගෙවීම් කිරීමේදී පස සාරවත් කිරීම රහිතව පහත සඳහන් පරිදි හෙක්ටයාරකට රුපි.390,000/= වන සේ ගෙවීමට කටයුතු කලයුතුවේ.

| වාරිකය | හෙක්ටයාරයකට (රුපියල්) |
|---|---|
| 01.බිම් සැකසීම | 140,000 |
| 02.තේ වගා කිරීම | 200,000 |
| 03.වසරක් තුල නඩත්තුව | 50,000 |
| **එකතුව** | **390,000** |

II. පස සාරවත් කිරීමෙන් තොරව අලුත් වගාව යටතේ ඇති අනෙකුත් කොන්දේසි චක්‍රලේඛ අංක 69 පරිදි ඒ ආකාරයෙන් බලපැවැත්වේ.

3. වෙනත් කරුණු

2021.01.01 දින සිට බලපැවැත්වෙන තේ වගා සහනාධාර සංශෝධනයන්ට අනුව තේ නැවත වගාවේදී මුළු ඉඩම් අයිතිය අක්කර එකක් හෝ ඊට අඩු රජයේ හෝ පුද්ගලික අංශයේ ස්ථිර රැකියාවක් හෝ වෙනත් ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති කුඩා තේ වතු හිමියන්ට උපරිම අක්කර ½ ක් නැවත වගා කිරීම වෙනුවෙන් පැල සිටුවීමෙන් පසු මාසිකව රු. 5000/= ක දීමනාවක් නැවත වගා කල බිම් ප්‍රමාණයට සමානුපාතිකව මාස 24 ක කාලයක් ගෙවීමට කටයුතු කරනු ලැබේ. 2021 වසරේ සිට ඉදිරියට නිකුත් කරන අවසරපත්‍ර සඳහා පමණක් මෙම ගෙවීම් සිදුකෙරෙන අතර මේ පිලිබඳව උපදෙස් අංක 87/01 චක්‍රලේකය මගින් ඉදිරිපත් කෙරෙනු ඇත.

මෙම චක්‍රලේඛය ලද බවත් ඒ අනුව ක්‍රියාකරන බවත් සනාථ කලයුතුය. මේ පිළිබඳව ඔබගේ සියළුම කාර්යය මණ්ඩලය දැනුවත් කලයුතු අතර දැන්වීම් පුවරුවේ දැන්වීමක් ප්‍රදර්ශණය කිරීමටද කටයුතු කරන්න.

**ආචාර්ය එම්.එස්.ටී. ප්‍රියදර්ශන**
සභාපති

පිටපත්:-

01.සාමාන්‍යාධිකාරී
02.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන/ව්‍යාප්ති)
03.අභ්‍යන්තර විගණක
04.කළමනාකරු (සංවර්ධන/මානව සම්පත්/මුදල්/සැලසුම් හා නියමුකරණ)
05.සියලුම මාණ්ඩලික නිලධාරීන්
06.සියලුම කලාප තේ සංවර්ධන නිලධාරීන්
07.සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
08.ගරු ලේකම්/ගරු සභාපති සමස්ත ලංකා සමිති සංවිධානය